මැයි 18 දින සැමරුම්: සිරස්තල කිහිපයක්, කෝණයන් දෙකක්!
යුද්ධයේ අවසන් අදියරේදී මිය ගිය දෙමළ ජනතාව සැමරීම්, මැයි 18, 2023 අනුස්මරණ දිනයේදී පැවැත්විණි.
ඒ සම්බන්ධයෙන් මැයි 19, 2023 දින සිංහල භාෂා පුවත්පත් කිහිපයක සිරස්තල ඔස්සේ වාර්තා වී තිබුණේ මේ අයුරිනි.
* කොටි සැමරුම් - දිනමිණ, දිවයින, ලංකාදීප
* (යුද්ධයෙන් මිය ගිය අය සිහි කෙරෙන) මුල්ලිවයික්කාල් යුද සැමරුම, යුද්ධයේදී මියගිය දෙමළ ජනයා සිහිකිරීමේ උළෙල - මව්බිම, අද, අරුණ
1) ඇතැම් පුවත්පත් තුළ දැක්වෙන ආකාරයට, යුද්ධයෙන් මියගිය දමිළ ජනතාව සිහි කෙරෙනා අනුස්මරණයන්, තවත් පුවත්පත් තුළ "කොටි සැමරුම්" ලෙසින් රාමු ගත කොට ඇත්තේ මන්ද?
2) අනුස්මරණයන් පැවැත්වෙන්නේ යුද්ධයෙන් මියගිය දමිළ ජනතාව සිහිපත් කිරීමට නම්, එම උත්සව "කොටි සැමරුම්" ලෙසින් ලේබල් කිරීම කෙතරම් සාධාරණ ද? ඒ ඔස්සේ, එක් වාර්ගික ජන ප්‍රජාවක් - එනම් දමිළ ජනතාව- කොන් කිරීමේ ආකල්පයක්ද සමාජය තුළ ඇති නොකරන්නේ ද?
3) ඒ අනුව වඩාත් පිළිගත හැකි වාර්තාකරණය(න්) වන්නේ මින් කුමක්ද?

# මැයි 18 දින සැමරුම්
## සිරස්තල කිහිපයක්, කෝණයන් දෙකක්

බොරැල්ල කනත්තේ කොටි සැමරුව දෙපිරිසක් ගැටේ පොලිසිය මැදිහත් වී විසුරුවයි

දිනමිණ The Dinamina 2023-05-19




මව්බිම 2023-05-19

කොළඹ කොටි සැමරුම විරෝධතා මැද නවතී

දිවයින 2023-05-19

මුල්ලි වයික්කාල් යුද සැමරුම

අද 2023-05-19

බොරැල්ලේ කොටි සමරද්දී තව පිරිසක් විරෝධතාවක

ලංකාදීප 2023-05-19

යුද්ධයේදී මියගිය දෙමළ ජනයා සිහිකිරීමේ උළෙලට සිංහල රාවයේ විරෝධය

පොලිසිය දෙපිරිසම විසුරුවා හරියි

අරුණ 2023-05-19